කොළඹ විශ්වවිද්‍යාලය

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී තුන්වන වසර පරීක්ෂණය 2018 / 19

(දෙවන සෙමෙස්තර අවසාන විභාගය)

# ENH 3247 - සංචාරක ආර්ථික විද්‍යාව හා හෝටල් කළමනාකරණය

කාලය පැ දෙකකි (02)

ප්‍රශ්න අංක එක (01) ඇතුළු ව ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න

*(ප්‍රශ්න අංක එක (01) අනිවාර්ය ය වේ)*

---

1. ජාත්‍යන්තර ආගමන සංචාරක කර්මාන්තය (International Inbound Tourism) ගමනාන්ත රටකට (Destination Country) විශිෂ්ට අවස්ථාවක් වුව ද, ඒ හා සමග ඇතිවන බොහෝ ගැටළු සහ අභියෝග පිළිබඳව ද ඒ හා සමගාමීව ආමන්ත්‍රණය කල යුතු ය.

අ) වර්තමාන ගෝලීය සංචාරක කර්මාන්තයේ පවතින ප්‍රධාන ප්‍රවණතා සහ රටාවන් පිළිබඳව සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

ආ) සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව වෙත ගෝලීය සංචාරක කර්මාන්තයෙන් උත්පාදනය විය හැකි ප්‍රධාන ඉඩප්‍රස්ථාවන් පැහැදිලි කරන්න.

(ලකුණු 09)

ඇ) ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ගෝලීය සංචාරක කර්මාන්තයේ වර්ධනයේ වත්මන් ඉඩප්‍රස්ථාවන් කොතෙක් දුරට ග්‍රහණය කර තිබේද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 08)

2. "සේවා කර්මාන්තයක ඇති සමහර ලක්ෂණයන් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ ද දැකගත හැකි අතර ආර්ථිකයේ අනෙකුත් බොහෝ කර්මාන්ත හා අංශ සමඟ සංසන්දනය කරන විට වර්තමානයේ ශ්‍රී ලංකාවේ ආර්ථිකය කෙරෙහි එහි බලපෑම් වඩාත් තීරනාත්මක වී ඇත."

අ) සුදුසු උදාහරණ භාවිත කරමින් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ පවතින විශේෂ ලක්ෂණ සාකච්ඡා කරන්න.

(ලකුණු 13)

ආ) ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ සංවර්ධනයේ පවතින ප්‍රධාන ප්‍රවණතා සහ රටාවන් පැහැදිලි කරන්න.

(ලකුණු 12)

3. අ) සංචාරක කර්මාන්ත සංවර්ධනයේ වර්ගීකරණය (Typologies of Tourism Development) යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

(ලකුණු 10)

ආ) ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය ආශ්‍රිත සුදුසු උදාහරණ භාවිත කරමින් පහත සඳහන් සංචාරක කර්මාන්තයේ සංවර්ධනයන් විස්තර කරන්න.

1. කෘෂි කර්මාන්තය මත පදනම් කරගත් සංචාරක කර්මාන්තය (Agro-tourism)
2. සංස්කෘතිය මත පදනම් කරගත් සංචාරක කර්මාන්තය (Culture Tourism)
3. MICE සංචාරක කර්මාන්තය
4. ප්‍රජා මූලික සංචාරක කර්මාන්තය (Community-Based Tourism)
5. රුදෙස් සංචාරක කර්මාන්තය (Ecotourism)

(ලකුණු 15)

4. අ) ආහාරපාන මත පදනම් වූ සංචාරක කර්මාන්තය (Culinary Tourism) යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?

(ලකුණු 07)

ආ) ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ සංවර්ධනයට ආහාරපාන මත පදනම් වූ සංචාරක කර්මාන්තය මගින් ලබාදිය හැකි දායකත්වයන් මොනවා ද?

(ලකුණු 09)

ඇ) ආහාරපාන මත පදනම් වූ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ විභවතා සහ අනාගත අපේක්ෂාවන් පැහැදිලි කරන්න.

(ලකුණු 09)

5. 2019 දී සංචාරය කිරීම සඳහා හොඳම ගමනාන්තය ශ්‍රී ලංකාව ලෙස Lonely Planet මගින් ශ්‍රේණිගත කර ඇත.

අ) Lonely Planet ශ්‍රේණිගත කිරීම්වල වැදගත් කම කුමක් ද?

(ලකුණු 10)

ආ) Lonely Planet විසින් ශ්‍රී ලංකාව 2019 දී සංචාරය කිරීම සඳහා හොඳම ගමනාන්තය ලෙස නම් කිරීමට බල පෑ හැකි හේතු විවේචනාත්මකව පැහැදිලි කරන්න.

(ලකුණු 15)

6. අ) සංචාරක සේවාවේ පාරිභෝගියා (Customer) යන්නෙන් අදහස් කරන්නේ කවුරුන් ද?

(ලකුණු 05)

ආ) සංචාරක කර්මාන්තයේ පාරිභෝගික සේවා (Customer care) යන්නෙන් අදහස් කාරන්නේ කුමක් ද?

(ලකුණු 06)

ඇ) සංචාරක කර්මාන්තයේ සංවර්ධනය සඳහා පාරිභෝගික සේවා වැදගත් වන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 07)

ඇ) ඔබ කැමති සංචාරක සේවාවේ ඕනෑම පාරිභෝගියන් වර්ග තුනක් හඳුනා ගෙන සාර්ථක ව්‍යාපාරයක් පවත්වා ගැනීම සඳහා එවැනි පාරිභෝගියන් සමඟ කටයුතු කරන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 07)

***********